# MARKETING MANAGEMENT (Part-VII)


***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

## ඇසුරුම්කරණය (Packaging )

භාණ්ඩයක් සඳහා දවටනයක් (wrapper) හෙවත් මතුපිට ආවරණයක් හෝ බහලුවක් හෝ (Container) නිර්මාණය කිරීමේ හා නිපදවීමේ කාර්යය ඇසුරුම්කරණය (Packaging ) ලෙස හඳුන්වයි.

## ඇසුරුම (Package)

භාණ්ඩයකට ආරක්ෂාවක් ලබා දීම සඳහා යොදන දවටනය ඇසුරුම (Package) ලෙස හඳුන්වයි. ඇසුරුම සාමාන්‍යයෙන් සන්නම / වෙළෙඳ ලකුණ සහිත ව මුද්‍රණය කරන අතර එය ආවේණික ලක්ෂණවලින් යුක්ත වේ. ඇසුරුම දුටු පමණින් භාණ්ඩය පහසුවෙන් හඳුනාගත හැකි ය. ඇසුරුමක හැඩය, වර්ණය ඒකාකාරී වේ. ඇසුරුමක මූලික ම කාර්යය භාණ්ඩයකට ආරක්ෂාව ලබා දීම වුවත් වර්තමානයේ දී එය අලෙවිකරණ උපකරණයක් ලෙස ද භාවිත කරයි.

ClassWork.LK

# ඇසුරුම හඳුනාගත හැකි  මට්ටම් තුනකි.

## 1. ප්‍රාථමික ඇසුරුම (Primary Package )

භාණ්ඩයක ප්‍රථම ඇසුරුම ප්‍රාථමික ඇසුරුම යි.

**නිදසුන් :**

- කිරිපිටි බහා ඇති පොලියුරතීන් ඇසුරුම
- දන්තාලේප ටියුබය

## 2. ද්විතීයක ඇසුරුම (Secondary Package )

ප්‍රාථමික ඇසුරුමකට පිටතින් ඇති වෙනත් ඇසුරුමක්, ද්විතීයක ඇසුරුම ය.

**නිදසුන් :**

- කිරිපිටි ඇතුළත් පොලියුරතීන් ඇසුරුම බහා ඇති කාඩ්බෝඩ් ඇසුරුම
- දන්තාලේප ටියුබය බහාලන කාඩ්බෝඩ් ඇසුරුම

ClassWork.LK

## 3. ප්‍රවාහණ ඇසුරුම (Transportation Package)

ප්‍රාථමික හා ද්විතීයක ඇසුරුම් සහිත නිෂ්පාදිත තොගයක් ප්‍රවාහණය කිරීමේ දී භාවිත කරන විශාල බහාලුමවක්, ප්‍රවාහණ ඇසුරුම යි.

**නිදසුන් :**

- කිරිපිටි ඇතුළත් කාඩ්බෝඩ් පෙට්ටි 24ක් බහාලූ විශාල පෙට්ටියක්.
- දන්තාලේප ටියුබ් පෙට්ටි 120ක් ඇසුරූ විශාල පෙට්ටියක්.

ClassWork LK

# ඇසුරුමක් සැලසුම් කිරීමේ දී සැලකිය යුතු කරුණු

- නිෂ්පාදිතයේ ස්වභාවය.

  **නිදසුන් :**

  - කැඩෙන බිඳෙන සුලු බව
  - දියර වර්ග ද ඝන වර්ග ද යන බව
  - නශ්‍ය වන සුලු බව

- ඇසුරුමෙන් නිෂ්පාදිතයට ලැබෙන ප්‍රයෝජන

  **නිදසුන් :**

  - නිෂ්පාදිතයට ආරක්ෂාවක් ලැබීම
  - නිෂ්පාදිතය හඳුනා ගැනීමට පහසු වීම
  - නිෂ්පාදිතය පිළිබඳ තොරතුරු සැපයීම
  - ආකර්ෂණීය පෙනුමක් ලබා දීම

ClassWork.LK

- තාක්ෂණික යෝග්‍යතාව

  **නිදසුන් :**

  - සෞඛ්‍යාරත්ෂිත බව
  - රසායනික ද්‍රව්‍ය අඩංගු වී ඇති බව
  - කල් තබා ගත හැකි බව

- ඇසුරුමේ අංග

  **නිදසුන් :**

  - දිග, පළල, බර
  - නිෂ්පාදිතයේ හැඩය

- වෙළෙන්දාට ඇති පහසුව

  **නිදසුන්:**

  - ගබඩාකරණයට ඇති පහසුව
  - ප්‍රදර්ශනයට ඇති පහසුව
  - ප්‍රවාහණයට ඇති පහසුව

ClassWork.LK

- පාරිභෝගිකයාට ඇති පහසුව හා ප්‍රයෝජන

  **නිදසුන්:**

  - තෝරා ගැනීමට
  - රැගෙන යාමට
  - වෙනත් ප්‍රයෝජන සඳහා භාවිත කළ හැකි වීම

- පරිසර හිතකාමී බව

  **නිදසුන් :**

  - ප්‍රතිචක්‍රීකරණය කළ හැකි වීම
  - දිරාපත් වන බව

- ඇසුරුම සඳහා වැය වන පිරිවැය

ClassWork.LK

## ලේබල්කරණය (Labeling)

නිෂ්පාදිත භාවිතයට/පරිහරණයට අවශ්‍ය තොරතුරු ඇසුරුමේ දැක්වීම හෝ පාරිභෝගිකයා ආකර්ෂණය සඳහා ලේබලයක් නිර්මාණය කිරීම හා එයට අදාළ ක්‍රියාවලිය ලේබල්කරණය ලෙස හඳුන්වයි.

## ලේබලය (Label)

නිෂ්පාදිතය පිළිබඳ යම් යම් තොරතුරු දැක්වීම සඳහා ඇසුරුමේ ම කොටසක් ලෙෂ යොදා ගනු ලබන්නේ ලේබලය යි.

ClassWork.LK

# ලේබලයක ඇතුළත් විය යුතු කරුණු

- නිෂ්පාදනය සම්බන්ධ තොරතුරු
  (නිෂ්පාදකයා, නිෂ්පාදිත රට, ලියාපදිංචි අංකය )
- භාණ්ඩයේ නම හෝ සන්න
- මිල
- අඩංගු ද්‍රව්‍ය
- නිෂ්පාදිත දිනය
- කල් ඉකුත් වීමේ දිනය
- ගබඩා කිරීමේ හා ප්‍රවාහණයට හා භාවිත කිරීමට උපදෙස්
- අනතුරු ඇඟවීම් / අවවාද
- ප්‍රමිති ලාංඡන

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura